**හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව**
**පොළොන්නරුව දිස්ත්‍රික්කය**
**-------------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**
**----------------**

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 11 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 04 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 ජුනි 28 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ

(අ) ප්‍රාදේශීය සභාව සතුව පැවති වටිනාකම රු. 1,480,914 ක් වූ වත්කම් තුනක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාව සතුව පවතින කඩ කාමර 47 ක්, නිවාස 09 ක් හා ජල යෝජනා ක්‍රම 07 කට අදාළ ස්ථාවර වත්කම් වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) හිඟුරක්ගොඩ ඉරිදා පොළ පවත්වාගෙන යනු ලබන දුම්රිය රක්ෂිත ඉඩම වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බදු වටිනාකම රු. 2,925,557 කින් අඩුවෙන් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු බදු මුදල වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව හා ලෙජරයට අනුව වත්කම් විෂයයන් 02 ක වටිනාකම්වල රු. 355,977 ක වෙනසක් තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ජයන්තිපුර ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සඳහා වැයකළ රු. 583,229 ක මුදල ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට අනුව ලැබිය යුතු දැහි වටිනාකම රු. 62,436,794 ක් වුවද, එයට අදාල ගිණුම්කරණ සටහන්වලට අනුව එම වටිනාකම රු. 49,856,201 ක් වූයෙන් රු. 12,580,593 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු. 435,742,983 ක් වූ වත්කම් විෂයයන් 5 ක් අයිතිය තහවුරු කිරීමේ ලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා හා විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

1.3.3 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

---

පහත දැක්වෙන නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මු.රෙ. 571, 572 | තැන්පත් කර වසර 2 සිට 7 දක්වා කාලයක් ගත වී ඇති රු. 1,143,824 ක් වටිනාකමැති නිදහස් කළහැකි තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන රීති) | |
| (i) රීති අංක 19 | 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නිකුත් කර තිබුණු ලදුපොත් 10 කට අදාල උපපත්‍රිකා, 2017 අප්‍රේල් මාසය අවසන් වන විටත් අපසු භාරදී නොතිබුණි. |
| (ii) රීති අංක 59 සිට 63 දක්වා | සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) රීති අංක 203, 204 හා 218 | සභාවේ දේපල සම්බන්ධ පූර්ණ සමීක්ෂණයක් කර නොතිබුණි. |
| (ඇ) චක්‍රලේඛ හා චක්‍රලේඛ ලිපි | |
| 1995 ජනවාරි 29 දිනැති අංක NCP/PL/4/2/10/1/92 දරන උතුරුමැද පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | පළාත් පාලන ආයතනවල සේවය කරන නිලධාරීන් පරිහරණය කරනු ලබන හා භාරයේ ඇති වත්කම්වල ස්වභාවය අනුව සේවක ඇප මුදල් අය කළ යුතු වුවත්, සභාව විසින් එසේ කටයුතු කර නොතිබුණි. |

**2** **මූල්‍ය සමාලෝචනය**

--------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි ආදායම රු. 16,564,229 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි ආදායම රු. 689,653 ක් විය.

2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

--------------------------------------

2.2.1 වරිපනම්

-----------

වර්ෂය ආරම්භයේ අයවිය යුතු රු. 2,341,535 හා වර්ෂය තුළ බිල්කල රු. 2,162,203 ද සමඟ අයකර ගත යුතු මුළු වරිපනම් ආදායම වූ රු. 4,503,738 න් අයකරගෙන තිබුණේ රු. 1,741,956 ක් හෙවත් සියයට 38 ක් පමණි

2.2.2 බදුකුලී

--------

වර්ෂය තුළ බිල්කළ කඩකුලී ආදායම වූ රු. 3,389,267 න් අයකරගෙන තිබුණේ රු. 1,732,604 ක් හෙවත් සියයට 51 ක් පමණි.

2.2.3 වෙනත් ආදායම්

--------------------

වර්ෂය ආරම්භයේ පැවති රු. 7,501,738 ක හිඟය හා වර්ෂය තුළ බිල්කළ රු. 1,778,431 ක් සමඟ මුළු ක්‍රියාත්මක ආදායම වූ රු. 9,280,169 න් රැස්කරගෙන තිබූ ආදායම රු.578,946 ක් හෙවත් සියයට 6 ක් පමණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්ය සාධනය

------------------

2016 අයවැය ලේඛනය මඟින් රු. 3,750,000 ක් ප්‍රතිපාදනය වෙන්කර ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබූ ව්‍යාපෘති 16 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

(අ) හිඟුරක්ගොඩ ඉරිදා පොල පවත්වාගෙන යනු ලබන දුම්රිය රක්ෂිත ඉඩම වෙනුවෙන් ගෙවිය යුතු බදු මුදල් දිගින් දිගටම ගෙවීම පැහැර හැර තිබීම නිසා 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බදු මුදල රු. 3,762,617 ක් වී තිබුණු අතර 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදල මෙතෙක් හඳුනාගෙන නොතිබුණි.

(ආ) හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවට අයත් රජයේ නිවාස 2 ක් පදිංචිකරුවන් විසින් පවරාගැනීමට උත්සාහ දරමින් සිටින නමුත් ඒ සම්බන්ධව වගකිවයුතු නිලධාරීන්ගේ අවධානය යොමුවී නොතිබුණි.

3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

ධාවන තත්ත්වයේ නොපවතින ට්‍රැක්ටරයක්, බැකෝ ලෝඩරයක්, ලොරියක් හා ඩබල් කැබ් රථයක් අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට හෝ අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

3.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

-----------------------------------

රු. 360,928 ක් වටිනා කොඩිකණු 326 ක් හා රු. 76,000 ක් වටිනා ලැප්ටොප් පරිගණකයක් භෞතික පරීක්ෂාවට ඉදිරිපත් නොකෙරුණි.

3.5 හඳුනාගත් අලාභ

-------------------

(අ) සමාලෝචිත වර්ෂය සඳහා කඩකුලී ආදායම් රැස් කිරීමේදී නියමිත තක්සේරු වටිනාකම් සැලකිල්ලට නොගෙන 2003 වර්ෂයේ තක්සේරු වටිනාකම මත ගාස්තු අය කිරීම හේතුවෙන් රු. 3,156,000 ක වටිනාකම වූ ආදායම් අහිමි වී තිබුණි.

(ආ) හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් හිඟුරක්ගොඩ මහෙස්ත්‍රාත් භූමියේ ඉදිකරන ලද නීතිඥ කාර්යාල පරිශ්‍රයට අදාළ ඉඩම පවරා ගැනීමටත්, ඉදිකර අවසන් කර ඇති කඩ කාමර 16 ක් සඳහා අයකරගත යුතු ටෙන්ඩර් ගාස්තු රු. 3,465,325 ක් හා මාසික කුලී මුදල් රු. 432,000 ක් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

(අ) ප්‍රාදේශීය සභාව විසින් දිනකට එකතු කරන ටොන් 06-07 අතර ප්‍රමාණයක අපද්‍රව්‍ය නිසි කළමනාකරණයට ලක් කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂය සඳහා සභාව විසින් සකස් කර තිබූ කසල කළමනාකරණය පිළිබඳ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මඟින් ඝන අපද්‍රව්‍ය කළමනාරණය පිළිබඳ අවධානය යොමුකර නොතිබූ අතර 2017 ක්‍රියාකාරී සැලැස්ම අනුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ගොඩනැඟිලි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

**04 පද්ධති හා පාලන**

**-----------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

පාලන ක්ෂේත්‍ර

----------------

(අ) ස්ථාවර වත්කම් පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) ණයගැති/ණයහිමි පාලනය
(ඉ) අභ්‍යන්තර විගණනය
(ඊ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය